# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2141/77 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වැනි වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහනවයක් වූ සැප්තැම්බර් මස 20 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය කොට්ඨාසයේ මෙල් අක්කරෙයිපත්තු දකුණ, දළුව ග්‍රාමයේ කරුන්කලියාඩිහි පිහිටි ''පෙරිය පුහෙයිලෙයි තෝට්ටම්'' නැමති ඉඩම වේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දළුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි බලයලත් මිනින්දෝරු එන්. සංකරලිංගම් විසින් සාදන ලද අංක 117 දරන 1985.04.04 දිනැති පිඹුරේ නිරූපිත ලොට් අංක 1 දරන බිම් කැබැල්ල උතුරට : ජසින්තාට අයත් ඉඩම ද, නැගෙනහිරට : ජෝර්ජ් ගාමිණිට අයත් ඉඩම ද, දකුණට : එම්. අම්ර්තම්ට අයත් ඉඩම ද, බස්නාහිරට : වී. සී. පාර (පල්ලිය පාර) ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හයක (අ. 00 රූ. 01 ප. 06) විශාලත්වයෙන් යුත් ඉඩම, ගහ කොළ සහ ඒ මත පිහිටි සැම සියළු දේත් සමග ය.

මෙම දේපළ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 10/85 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

10 - 140